# ලෝකයේ
# කැපී පෙනෙන විප්ලව

# ඇමරිකානු නිදහස් සටන

## (නියෝජිතයන් නැත්නම් බදුත් නැත)

### ඇමරිකාව සොයා ගැනීම


### ඇමරිගෝ වෙස්පුචි



# යුරෝපීයන් ඇමරිකාවේ ජනපද පිහිටවීමට බලපෑ හේතු

- යුරෝපයේ පැවති රෝමානු කතෝලික රෙපරමාදු ආගමික ගැටුම් නිසා නිදහස පතා
- නව ඉඩම් අත්පත් කරගැනීමට
- කීර්තිය හා ධනය වර්ධනයට

# බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකාවේ පිහිටවූ ජනපද




1. වර්ජිනියා
2. මැසචුසෙට්ස්
3. නිව්යෝර්ක්
4. නිව්හැම්ෂයර්
5. මේරිලන්ඩ්
6. කනේක්ටිකට්
7. රෝඩ් දිවයින
8. ඩෙලවෙයාර්
9. උතුරු කැරොලිනා
10. නිව් ජර්සි
11. දකුණු කැරොලිනා
12. පෙන්සිල්වේනියා
13. ජෝර්ජියා

# නිදහස් සටනට බලපෑ හේතු

- බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් නව බදු හඳුන්වා දීම.
  - ✓ මුද්දර බද්ධ
  - ✓ තේ වීදුරු, කඩදාසි සඳහා බදු අය කිරීම.
  - ✓ 'නියෝජිතයන් නැත්නම් බදුත් නැත' යන විශ්වාසය
- බ්‍රිතාන්‍ය ජාතිකයෝ ජනපදවලින් ලාභ ඉපයීම පමණක් අපේක්ෂා කිරීම
- බොස්ටන් තේ සාදය
- ජෝර්ජ් වොෂිංටන් සටනේ නායකත්වය ගැනීම
- ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
- නිදහස් සටන ජය ගැනීම

# නිදහස් සටනේ ප්‍රතිඵල

- ඇ.එ.ජ නිදහස් රාජ්‍යයක් බවට පත්වීම
- ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එහි මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනය
- ප්‍රථම ලිඛිත සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- සමස්ථ මානව සංහතියට නිදහසේ අගය පෙන්වාදීම හා එය ප්‍රංශ විප්ලවයට ආදර්ශයක් වීම

# ප්‍රංශ විප්ලවය

## (නිදහස, සමානාත්මතාවය සහ සහෝදරත්වය)



"කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සමාජ විද්‍යා අංශය"



- (හිතුවක්කාර දූෂිත පාලනයක් ගෙනගිය 16 වන ලුවී රජුට එරෙහිව එහි ජනතාව තම මානව අයිතීන් දිනා ගැනීම සඳහා ගෙනගිය අරගලය)

# ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු

## දේශපාලන

- රාජ්‍යත්වය දේව වරමක් ලෙස සැලකීම. 'රාජ්‍ය නම් මමය '- 14 ලුවී
- සෘජුව තිබූ අසීමිත බලය
- සතුරන් මැඩලීමට රාජ්‍ය බලය යොදාගැනීම
- රජුගේ අති සුඛෝපභෝගී ජීවිතය
- දූෂිත රාජාණ්ඩු

## සමාජ

- වැඩවසම් සමාජය
- පංති සහිත සමාජයක් පැවතීම හා පංති අතර දුර්භිබව
- මධ්‍යම පන්තියට සමාජයේ තැනක් හිමි නොවීම

## ආර්ථික

- ප්‍රංශ භාණ්ඩාගාරය බංකොලොත්වීම
- අධික බදු බර
- මධ්‍යම පන්තියේ බදු අයකර නොගැනීම

## වෙනත් හේතු

- දාර්ශනික මතවාද (රූසෝ, මොන්ටෙයිත්සු, වෝල්ටෙයාර්)
- ඇමරිකානු නිදහස් සමයේ බලපෑම්

"කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සමාජ විද්‍යා අංශය"

# රුසියන් විප්ලවය

## (සාමය, ඉඩම් හා ආහාර)



"කෑගල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ සමාජ විද්‍යා අංශය"

# රුසියානු විප්ලවය

(දූෂිත ඒකාධිපති රාජාණ්ඩුව හා වැඩවසම් සමාජ ක්‍රමයට එරෙහිව ගොවි කම්කරු ජනතාව රජයට එරෙහිව ගෙනගිය විප්ලවය)

## විප්ලවයට බලපෑ හේතු

- දූෂිත ඒකාධිපති රාජාණ්ඩුව
- දූෂිත වැඩවසම් සමාජ ක්‍රම
- අධික බදු බර
- රුසියන් ජපන් යුද්ධයෙන් රුසියාව පැරදීම
- ලෙනින්ගේ නායකත්වය
- කැරලිකරුවන් මැඩලීමට රජය ගෙනගිය පියවර
- කැරලිකරුවන් සංවිධානය වීම
- ගොවීන් සොල්දාදුවන් වීමේ අර්බුදය
- සොල්දාදුවන් කැරලිකරුවන්ට එක්වීම
- කෙරෙන්ස්කිගේ තාවකාලික අසාර්ථක ආණ්ඩුව
- පංති රහිත සමාජයක් ගොඩනැගීම
- ලෙනින් ජයගැනීම

# ප්‍රතිඵල

- රටට සාමය උදාවීම
- පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසිවීම හා සමීප ගොවිපලවල් ආරම්භය
- ජනසතු ව්‍යාපාරය
- රාජාණ්ඩු වෙනුවට සමාජවාදී සමූහාණ්ඩු පිහිටවීම
- සමාජවාද දර්ශනය ලොවපුරා පැතිරවීම
- කොමියුනිස්ට් පක්ෂ බිහිවීම
- නිර්ධන පන්ති විප්ලව ලොවපුරා පැතිරීම

# ඇමරිකන් නිදහස් සටන

## I කොටස

1. ඇමරිකාවේ මුල් පදිංචිකරුවන් ලෙස සැලකෙන්නේ කවුරුන් ද?
2. ඇමරිකාව ඉන්දියාවට අයත් ප්‍රදේශ නොව වෙනම භූමියක් බව ප්‍රකාශකලේ කවුරෙක් ද?
3. ඇමරිකාවේ ජනපද පිහිටුවන ලද යුරෝපීය ජාතීන් නම් කරන්න.
4. බ්‍රිතාන්‍යයන් විසින් ඇමරිකාවේ පිහිටවූ මුල්ම හා අවසාන ජනපද නම් කරන්න.
5. නිදහස් ඇමරිකාවේ ප්‍රථම ජනාධිපති කවුරුන් ද?
6. ඇමරිකානු ජනපද වාසීන් බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව ගෙනගිය සටන් පාඨය ලියන්න.
7. ප්‍රථම මහද්වීපික සම්මේලනයේ නම කුමක් ද?
8. ඇමරිකානු විප්ලවයේ ආරම්භය ලෙස සැලකෙන්නේ කුමන සිදුවීම ද?
9. ඇමරිකානු ජනපදිකයින්ගෙන් ක්‍රමානුකූලව බදු අයකිරීමට පියවර ගත් බ්‍රිතාන්‍යය අගමැතිවරයා නම් කරන්න.
10. උතුරු ඇමරිකාවේ ජනපද පිහිටවාගත් යුරෝපීයන් නම් කරන්න.

# ඇමරිකන් නිදහස් සටන

II කොටස

1. යුරෝපීයන් ඇමරිකාවේ ජනපද පිහිටුවීමට හේතු නම් කරන්න.

2. ඇමරිකානු නිදහස් සටනට බලපෑ හේතු නම් කරන්න.

3. බ්‍රිතාන්‍යයන් ඇමරිකා එක්සත් ජනපදයේ පිහිට ජනපද 5 ක් නම් කරන්න.

4. ජෝර්ජ් ග්‍රැන්විල් ආදායම් වැඩිකර ගැනීම සඳහා ඇමරිකන් වාසීන් වෙත පනවන ලද බදු පනත් 3 නම් කරන්න.

5. ඇමරිකානු නිදහස් සටනේ ප්‍රතිඵල සඳහන් කරන්න.

# ප්‍රංශ විප්ලවය

## I කොටස

1. ප්‍රංශ විප්ලවය සිදුවූ වර්ෂය ලියන්න.
2. ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන තේමාව නම් කරන්න.
3. ප්‍රංශ විප්ලවය සමයේ ප්‍රංශය පාලනය කළ රාජ වංශය සහ එහි කැපී පෙනෙන රජවරු දෙදෙනෙකු නම් කරන්න.
4. දාහතරවන ලුවී රජුගේ ප්‍රකාශය ලියන්න.
5. ප්‍රංශයේ දූෂිත පාලනයේ සංකේතය බදු වූ බන්ධනාගාරය කුමක් ද?
6. 16 වන ලුවී රජුගේ රජ වාසල හා අග බිසව නම් කරන්න.
7. ප්‍රංශ විප්ලව සමයේ එහි පැවති සමාජ ස්ථර නම් කරන්න.
8. ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත ප්‍රංශ පාලන මණ්ඩලය කුමක් ද?
9. ප්‍රංශ විප්ලවයට පසුබිම සකස්කළ දාර්ශනිකයන් කවුරුන් ද?
10. ප්‍රංශ විප්ලවවාදීහූ ජාතික ආරක්ෂක හමුදාවක් පිහිටුවා ගත්තේ කුමන නායකයා යටතේ ද?

# ප්‍රංශ විප්ලවය

II කොටස

1. ප්‍රංශ විප්ලවයට බලපෑ සමාජ, ආර්ථික, දේශපාලන හේතු 2 බැගින් ලියන්න.
2. ප්‍රංශ රදල පන්තිය භුක්ති විඳි වරප්‍රසාද මොනවා ද?
3. ප්‍රංශ භාණ්ඩාගාරය බංකොලොත් වීමට බලපෑ හේතු මොනවා ද?
4. ප්‍රංශ ජනතාව පීඩනයට පත්කළ බදු වර්ග සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න.
5. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල මොනවා ද?

# රුසියන් විප්ලවය

## I කොටස

1. රුසියාව පාලනය කළ රාජ වංශය නම් කරන්න
2. රුසියානු විප්ලවයේ ප්‍රධාන තේමාව කුමක් ද?
3. රුසියානු පාර්ලිමේන්තුව එවකට හැඳින්වූ නම කුමක් ද?
4. රුසියාවේ පැවති ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක නම් කරන්න.
5. 1917 මාර්තු විප්ලවයට සම්බන්ධ ලෙනින්ගේ ප්‍රකාශය කුමක් ද?
6. සාර් පාලනයෙන් පසු රුසියාවේ බලයට පත් නායකයා නම් කරන්න.
7. බෝල්ෂෙවික් වරුන්ගේ දර්ශනය කුමක් ද?
8. රුසියාවේ රාජ්‍ය විරෝධි කැරැල්ලක් ඇතිවීමට බලපෑ හේතුව කුමක් ද?
9. පහත වගුව පුරවන්න.

| යුධභටයන්ට | |
|---|---|
| | ඉඩම් |
| සැමට | |

(ආහාර, ඇදුම්, සාමය, නිවාස, ගොවීන්ට, කම්කරුවන්ට)

10. බලවත් සටනකින් තොරව ජයගත හැකිවූයේ කුමන විප්ලවය ද?

# රුසියන් විප්ලවය

## II කොටස

1. 1917 මාර්තු හා ඔක්තෝම්බර් විප්ලව කෙටියෙන් පැහැදිලි කරන්න.
2. රුසියන් විප්ලවයට බලපෑ හේතු ලියන්න.
3. රුසියන් විප්ලවයේ ප්‍රතිඵල මොනවා ද?
4. සමාජවාදී දර්ශනය ව්‍යාප්ත වූ ලොව වෙනත් රටවල් මොනවා ද?
5. පහත රූප නම් කරන්න.

